*සැ. යු.*- 2010.12.31 දින පළ වූ අංක 1,687 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,688 - 2011 ජනවාරි මස 07 වැනි සිකුරාදා - 2011.01.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 2 |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජනවාරි මස 14 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 දෙසැම්බර් මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1 - B 80187— 7,100 (2011/01)
F1-(S/E)

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ වයඹ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2010

වයඹ පළාත් රාජ්‍ය සේවයේ වයඹ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු සංඛ්‍යාව :* 20

02. *වැටුප් ක්‍රමය :*

2.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) හි MN 1/2006 A අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය - රු. 13,120 - 10x145 - 11 x 170 - 10 x 320 - රු. 22,040.

*සටහන* 1 :

මෙම වැටුප් ක්‍රමය වරින් වර කරනු ලබන සංශෝධනවලට යටත් වේ. මෙම තනතුරට බඳවා ගන්නා නිලධාරීන් මාසික වැටුප් පියවර රු. 13,555ට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.2 *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් සිය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

2.3 *සේවා කොන්දේසි* :

අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තනතුරට පත් වූ දින සිට වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් අයකරනු ලැබේ.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

3.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ සහ ගණිතය යන විෂයන් ඇතුළු විෂයන් 03කට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම.

3.2 *වෘත්තීය සුදුසුකම්.*-රජය පිළිගත් පේෂකර්මාන්ත පුහුණු ආයතනයකින් ලබාගන්නා ලද තුන් අවුරුදු හෝ දෑ අවුරුදු අවසාන සහතික පත්‍ර විභාගය සමත්ව තිබීම.

*සැ. යු.*- ඉහත සියලු අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් 2011.02.15 දිනට සම්පූර්ණකර සහතික ලබා තිබිය යුතුය.

04. *අපේක්ෂකයන්* :

4.1 ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

4.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් පදිංචිය සනාථ කළ යුතු ය.)

4.3 දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකුනම්, ඔහු/ඇය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

4.4 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.*-

පත්වීම් නිලධාරියා විසින් තීරණය කරනු ලබන ආකාරයට *රජයේ ගැසට් පත්‍රයේ* (පළාත් සභා කොටස) හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම් මගින් අයදුම්පත් කැඳවීමෙන් පසු වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිසම තීරණය කරනු ලබන පරිදි වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිසම හෝ බලය පවරනු ලබන ආයතනයක් විසින් සිදුකරනු ලබන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත එම විභාගයෙන් වැඩිම ලකුණු ලබාගන්නා අය සුදුසුකම් පරීක්ෂාකර බැලීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව පේෂකර්ම උපදේශක/උපදේශිකා III වැනි ශ්‍රේණියට බඳවා ගැනේ. පේෂකර්ම උපදේශක/උපදේශිකා III වැනි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 70% විවෘත තරග විභාගය මගින් ද, 30%ක් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණි වලින් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය මගින් ද සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. දෙපාර්තමේන්තුවේ සේවකයින් මගින් 30% ක් සම්පූර්ණ කළ නොහැකි වුවහොත් ඉතිරි පුරප්පාඩු ද විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

06. *විභාග ක්‍රමය* :

| | *විෂයයන්* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| (i) | පේෂ ගණිතය | පැය 01 | 100 |
| | පේෂ සටහන් | පැය 01 | 100 |
| | පේෂකර්මාන්ත පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 01 | 100 |
| | යාන්ත්‍රික ඇඳීම | පැය 01 | 100 |

ඉහත එක් එක් විෂයන්ට අදාලව බහුවරණ ප්‍රශ්න පත්‍ර සකස් කරනු ලැබේ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගතහොත් පමණි.

| | | | |
|---|---|---|---|
| (ii) | ප්‍රායෝගික පරීක්ෂණය – | පැය 01 | 100 |

මෙම ප්‍රායෝගික පරීක්ෂණය යන්ත්‍ර සවිකිරීම හා වියීම පිළිබඳ ප්‍රායෝගික දැනුම ඇගයීම සඳහා සිදු කරනු ලබන අතර, අදාල ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් ඉදිරියේ සිදුකරනු ලැබේ.

අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂමේ ලේකම් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු, වයඹ පේෂකර්මාන්ත පළාත් අධ්‍යක්ෂ හා වෙනත් දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරියෙකු යන අයගෙන් සමන්විත වේ. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම මෙහි දී සිදුකෙරේ.

07. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු හා ඉදිරියේ දී ඇතිවන පුරප්පාඩු විභාගයෙන් සමත් අයවළුන් සිටි නම් එම අයගෙන් පිරවීම පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

08. විභාග ගාස්තු වශයෙන් රු. 250.ක් වයඹ පළාත් සභා ගිණුමට බැරවන පරිදි තමුන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද ව. ප. ස. මු/2 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැළකිය යුතුය.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

9.1 මෙම නිවේදනයේ පහලින් ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2011.02.15 දිනට පෙර "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ "පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා III ශ්‍රේණියට බඳවා ගැනීම - 2010" යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු වේ.)

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :- 2011.02.15 වේ.

11. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබිය යුතුය. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

12. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය*.- අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත ;

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

***සටහන***.-විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත්වන අපේක්ෂකයින් විභාගයට සුදුසු අයවලුන් ලෙස සළකනු නොලැබේ.

13. යම්කිසි අපේක්ෂකයකුට, ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07කට පෙර නොලැබුණහොත් ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට දැන්විය යුතුය. එසේ දැනුම් දී පහත විස්තර ඉදිරිපත් කළ යුතුය.

(*අ*) විභාගයේ නම :————.

(*ආ*) අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය :————.

(*ඇ*) අයදුම්පත යොමු කළ ලිපිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය හා දිනය :————.

14. යම් අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කරනු ලැබේ.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණක් හෝ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඒ. ඩී. අමරසිරි,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2010 දෙසැම්බර් මස 15 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (වයඹ),
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

විභාග අංකය : [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ වයඹ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2010*

1.0 (*අ*) මුලකුරු සමග නම :————.

(*ආ*) සම්පූර්ණ නම :————.

(*ඇ*) ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.0 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.

3.0 (i) ස්ථිර ලිපිනය :————.

(ii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.)

කුරුණෑගල : [ ]     පුත්තලම : [ ]

(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2011.02.15 දිනට අදාල දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

අවු. : [ | ]     මාස : [ | ]     දින : [ | ]

(iv) දුරකථන අංකය : පෞද්ගලික :————.
රාජකාරී :————.

04. ස්ත්‍රී පුරුෂ භාවය : (අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : [ ]     පුරුෂ : [ ]

05. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ; (අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. උපන් දිනය ; අවු. :———, මාස :———, දින :———.

(*i*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2011.02.15 දිනට වයස ;

අවු. :———, මාස :———, දින :———.

(*ii*) ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? :————.

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3.1 යටතේ)

(අ) (*i*) අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :————.

(*ii*) විභාග අංකය :————.

| විෂය | ලබා ඇති සාමාර්ථය | | විෂය | ලබා ඇති සාමාර්ථය | |
|---|---|---|---|---|---|
| | පළමු වර | දෙවන වර | | පළමු වර | දෙවන වර |
| | | | | | |

(ආ) වෘත්තීය සුදුසුකම් (නිවේදනයේ අංක 3.2 යටතේ හදාරා ඇති පාඨමාලා හෝ තරගවලින් ලබා ඇති ස්ථාන පිළිබඳව පැහැදිලිව සඳහන් කරන්න.) :- (මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.) :————.

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :————.
දිනය :————.
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |

09. ..............................................................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් වයඹ පළාත් සභාවේ පේෂකර්මාන්ත උපදේශක/උපදේශිකා III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන.........................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බව ද, ඔහු/ඇය................................වැනි දින මා ඉදිරිපිට දී ඔහු ගේ/ඇය ගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිළ මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු හෝ වර්ෂයකට රු. 237,060 නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

(අනවශ්‍ය වචන කපා හරින්න.)

..............................................................මයා/මිය/මෙනවිය දැනට ............................................ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.................................................... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතැරගියා සේ සළකා ඇති/නැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

.............................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න).

01-145

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| ජනවාරි | 2011.01.07 | සිකුරාදා | 2010.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.14 | සිකුරාදා | 2010.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.21 | සිකුරාදා | 2011.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.28 | සිකුරාදා | 2011.01.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2011.02.03 | බ්‍රහස්පතින්දා | 2011.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.11 | සිකුරාදා | 2011.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.18 | සිකුරාදා | 2011.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2011.02.25 | සිකුරාදා | 2011.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2011.03.04 | සිකුරාදා | 2011.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.11 | සිකුරාදා | 2011.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.18 | සිකුරාදා | 2011.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.25 | සිකුරාදා | 2011.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.